සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2018** | **10 ශ්‍රේණිය** |
| *மூன்றாம் தவணைப் பரீட்சை* **2018** | தரம் **10** |
| **Third Term Test 2018** | **Grade 10** |

| | |
|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **පැය එකයි** |
| **சிங்களமொழியும் இலக்கியமும்** | **ஒரு மணித்தியாலயம்** |
| **Sinhala Language and Literature** | ***One hours*** |

විභාග අංකයඃ- ...................................

**1 පත්‍රය**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

- **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

(1) ඔවුහු දිවා රෑ නොබලා මහන්සි වූයේ **බඩගෝස්තරය** රැක ගැනීමට ය.
1. කුසගින්න නිවා ගැනීමට 2. සෞඛ්‍ය සම්පන්නව සිටීමට 3.ණය බරින් මිදීමට 4. පවුල රැක ගැනීමට

(2) ආයතනයේ පිරිහීම පිළිබඳව කතා කරද්දී ජයසේන **හාවක් හූවක් නැතිව** සිටියේය.
1. නිහතමානීව 2. මන්දෝත්සාහීව 3. ඉතා නිහඬව 4. බැගෑපත්ව

(3) සමහරු සුළු සිද්ධියක දී පවා **දෙබරයට ගල් ගැසීමට** මාන බලති.
1. නින්දා අපහාස කිරීමට 2. කලබලයක් ඇති කිරීමට 3. ගල්මුල් වලින් පහර දීමට 4. අලාභහානි කිරීමට

- **අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(4) සාහිත්‍ය නිර්මාණයක් බිහි වන්නේ සාහිත්‍යකරුවා තුළ පවත්නා ............................................... නිසා ය.
1. රසඥතාව 2. වින්දනය 3. අවබෝධය 4. ප්‍රතිභා ශක්තිය

(5) කෙසේ හෝ ලකුණු රැස්කර කණ්ඩායමට ලකුණු ලබා දීමේ අටියෙන් පිතිකරුවා ක්‍රීඩා පිටියට .............................
1. පහත් විය. 2. අවතීර්ණ විය. 3. සංක්‍රමණය වීය. 4. අනුගත විය.

(6) යතෝක්ත අරමුණ සාක්ෂාත් කර ගැනීමේදී පෙළ පොතට හිමි වන්නේ .................................. ස්ථානයකි.
1. අද්විතීය. 2. මාහැඟි. 3. අනුපමේය 4. වැදගත්.

(7) අකාරාදි පිළිවෙල නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
1. විෂ්ණු, විසන්ධි, විශාල, විෂය 2. කවන්ධය, කෂාය, කලපුව, කාණ්ඩය
3. පණහ, පණාව, පණිවිඩ, පඨවි 4. සංශෝධිත, සංසරණ, සංහරණ, සංස්පීත

(8) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. රමණීය, චණ්ඩ, පුතණු, ප්‍රකාශන 2. විමර්ෂන, ප්‍රශ්න, ප්‍රකාශන, දර්ශන
3. ප්‍රවනතා, අරමුණ, ප්‍රවීන, සංක්‍රමණ 4. නාගදරණ, උෂ්ණ, වර්න, මරන

(9) එක් එක් වචනවල මුලකුරෙහි ඇදය, දීර්ඝ පාපිල්ල, රකාරාංශය සහ ඇලපිල්ල පිළිවෙලින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
1. රුවල, නූල, කර්‍මය, කාලය, 2. කැත්ත, ඌරා, ක්‍රමය, මාමා
3. රුවනාර, සූකිරි, ප්‍රධාන, සාමා 4. වැලි, නූල, ක්‍රමය, කාලය

(10) "අකුසල් " යන වචනය අයත් වන්නේ ---------------- පදයකටය.

1. විරුද්ධ. 2. විශේෂණ 3. උපසර්ග 4. නිපාත

(11) "මිනිසා විසින් ගස කැපේ " යන වාක්‍යයේ උක්තය වන්නේ,

1. මිනිසා. 2. කැපේ 3. ගස 4. මිනිසා විසින්

(12) "මිනිසාගේ " යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කළ විට නිවැරදිව දැක්වෙන ආකාරය වන්නේ,

1. මිනි + සාගේ 2. මිනිසා + ගේ 3. මිනිස් + ආගේ 4. මිනිසා + අගේ

(13) නිපාත පදයක් නොයෙදුණු වාක්‍ය තෝරන්න.

1. හෙට පෙ.ව. 8.00 සිට විදුලිය විසන්ධි කරනු ලැබේ. 2. අනේ ! කුරුලු පැටියා මැරිලා

3. දුනුකෙයියා මලක් වගේ 4. තුරු පෙළ සුළඟට සෙලවෙයි.

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.**

(14) <u>සින්ධූපමාන</u> වැව්තලා මතින් ඇදී

1. වැව් 2. වැලිතලා 3. සාගරය හා සමාන 4. ගංගා

(15) <u>විලිකුන්</u> සුරත් පල වැනි වේ රිවි මඬල

1. කුකුළා 2. ඉදුණු 3. කෙසෙල් 4. වලිකුකුළා

(16) <u>ආනන කල</u> උගේ කට ගඳ නැද්දෝ

1. කට වැසීමට 2. ඇනුම් අරින කල 3. අනින විට 4. සිනසීම

(17 ) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත පිළිතුර තෝරන්න.

1. නිපාත - වගේ, මෙන්, ලු, සේ 2. කෘදන්ත - වැටුණු, දුවන්නා, කියුම්, කෙරුම්

3. තද්ධිත - ගුණවත්, ගැමියා, තොටියා, සිඟිති 4. උපසර්ග - ප, පර, සිරි, නි

(18 ) දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන ජලාශ නාමය ඇතුළත් වරණය තෝරන්න.

1. සා කැ මා ලේ වු ස් 2. ක ද මො ග ර හ ල

3. රි ක් ම ල වි ටෝ ව 4. ර ග න් ව දෙ ල න

(19 ) මුලින් දී ඇති පදයට සමාන නොවන පදයක් අඩංගු පද පේළිය තෝරන්න.

1. පියුම් - කමල්, පංකජ, අරවින්ද, නෙළුම් 2. හිරු - රිවි, රුපු, රවි, සහසකර

3. සයුර - සිඳු, රුවනාර, ආර්ණව, දළනිඳු 4. අත - හස්තය, බාහුව, බුජ, කර

(20 ) " ගුණැති " යන පදයෙහි සන්ධි නාමය වනුයේ,

1. පරස්වර ලෝප සන්ධිය 2. ස්වර සන්ධිය

3. ස්වරාදේශ සන්ධිය 4. පූර්වස්වරලෝප සන්ධිය.

(21 ) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. කරද්දි 2. කළොත් 3. කරමින් 4. කරවයි.

(22 ) යටි තොල හා උඩුතොල ආධාරයෙන් උපදින ශබ්ද හඳුන්වන්නේ,

1. තාලුජ 2. ඕෂ්ඨජ 3. මූර්ධජ 4. දන්තජ

(23 ) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ කුමක් ද ?

1. ආගමන - විගමන 2. ස්ථාවර - ජංගම 3. ආහ්ලාදය - ප්‍රමෝදය 4. සෘජු - වක්‍ර

(24 ) " සේරංගාව " යනුවෙන් හඳුන්වන්නේ ,

1. සොකඩ බැඳීම 2. ටකරං බැඳීම 3. අතු වැල 4. හුළං පෙති

- **අංක 25 සිට 27 යටතේ දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළු තෝරන්න.**

(25) එක් වතාවක් යමක් වැරදී කරදරයකට පත්ව යළි එම කරදරයට පත්වීම.

1. එළිපත්ත උඩ ඉන්න බළලා වගේ
2. කොටි වලිගය අල්ලා ගත්තා වගේ
3. රෑ වැටුණු වලේ දවල් වැටුණා වගේ
4. වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුණා වගේ

(26) ප්‍රයෝග කාරයාද උගුලට හසුවෙයි.

1. දී කිරට බළලුත් සාක්කි
2. නරියා පඹගාලේ පැටලුණා වගෙයි.
3. සෙක්කුවේ බැන්ද හරකා වගේ
4. පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ.

(27) තමන් නොකරන කාර්යය අනුන්ටද කිරීමට නොදීම.

1. පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ
2. සෙක්කුවේ බැන්ද හරකා වගේ
3. පාරු කාරයාගේ උම්බලකඩේ වගේ
4. අතු කඩා මොර කන්නා වගේ

(28) පහත (අ) කොටසෙහි දැක්වෙන පද සමඟ (ආ) කොටසෙහි දැක්වෙන ව්‍යාකරණ වර්ගය අනුපිළිවෙලින් ගැළපෙන වරණය තෝරන්න.

| | (අ) | | (ආ) |
|---|---|---|---|
| A | ඉහටි | E | උපසර්ග |
| B | නොලසා | F | කෘදන්ත |
| C | රැකුම් | G | නිපාත |
| D | ප්‍රබල | H | තද්ධිත |

1. F E G H
2. E F H G
3. G E F H
4. H G F E

- **අංක 29 , 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.**

(29)
1. මිනිස්සු අවංක නොවන්නේ ඇයි ?
2. මා එය කියවා ඇත්තෙමි.
3. මිනිසුන් අවංක නොවන්නේ ඇයි ?
4. අපි සාමය ළඟා කර ගන්නේ කවදා ද

(30)
1. සභා තොමෝ සතුටින් විසිර ගියා ය.
2. මා මහණදම් පිරිය යුත්තෙමි.
3. ඔවුහු එය වටහා ගැනීම යෙහෙකි.
4. ඕ තොමෝ ගමට ගියහ.

(31) " උදයග රැක සඳ මල් කැනක සිරි ගත " යන්නෙහි නිවැරදි අර්ථය වනුයේ

1. උදයට මල් පිපී ඇති බවකි.
2. උදය පර්වත නැමති ගසෙහි මල් කිනිත්තක සොබාව ගත්තා වූ චන්ද්‍රයා.
3. මල් කිනිත්තක සිරියාව උදයට තිබේ.
4. උදයට මල් පිපීම නිසා සිරියාවන් බවක් උසුලයි.

(32)

ගස වතු සුදු
වී පිරිසිදු
පොහොය නැතිදු
සිල් ගත් බඳු

ඉහත පද්‍යය රචනා කළේ ,

1. එච්. එම් කුඩලිගම
2. පී. බී. අල්විස් පෙරේරා
3. ඩබ්. ඒ අබේසිංහ
4. කුමාරතුංග මුනිදාස

(33) " එක හොඳකට තියෙන්නෙ , සාමන්‍ය යක්කු නෑ මෙතන " උද්ධෘතය ඇතුළත් නාට්‍ය කුමක් ද?
1. තලමල පිපිලා 2. හුණුවටයේ කතාව 3. සිංහබාහු 4. කිරි මුට්ටිය ගඟේ ගියා

(34) ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර නිවැරදිව අර්ථ ගන්වා නැති පද පේළිය තෝරන්න.
1. ඉන්තේරුවෙන් , හේමලයා - අතරමග , හෙවනැල්ල.
2. වෛතාලය, ගොන් කවඩියා - උදෑසන , මයිනා.
3. අකම්පාල වීම, සෝමාරියා - කනගාටු වීම , අලසයා
4. අල්ලි කේනවා, හොටබරියා - උදලු ගානවා, ඌරා

(35) අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව හඳුන්වන්නේ,
1. ව්‍යුත්පත්තිය 2. ව්‍යංගාර්ථය 3. ප්‍රතිභාව 4. පරිකල්පනය

(36) මොනරාගල ප්‍රදේශයේ " පුහුල් " යනුවෙන් හඳුන්වන්නේ ,
1. ගස් ලබු 2. කිරි අල 3. ඉරිඟු 4. වට්ටක්කා

(37) " නටති " යනු
1. ප්‍රථම පුරුෂ, බහු වචන කර්තෘකාරක, වර්තමාන කාල ක්‍රියා පදයකි.
2. උත්තම පුරුෂ, බහු වචන කර්මකාරක, අතීතකාල ක්‍රියා පදයකි.
3. මධ්‍යම පුරුෂ, ඒක වචන කර්තෘකාරක, වර්තමාන කාල ක්‍රියා පදයකි.
4. ප්‍රථම පුරුෂ බහු වචන, කර්මකාරක වර්තමාන කාල ක්‍රියා පදයකි.

(38) " ගුරුවරයා " යන පදයෙහි බහු වචන අනුක්ත පදය වන්නේ ,
1.ගුරුවරු 2. ගුරුවරුන් 3. ගුරුවරයෝ 4. ගුරුවරියෝ

- **අංක 39 සිට ප්‍රශ්නවල ඒ ඒ පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය ඇතුළත් වරණය තෝරන්න.**

(39) පලතුරු ඉක්මණින් නරක් වන බැවින් අපනයනයේ දී නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කළහොත් ඒවා හොඳ තත්ත්වයෙන් තබා ගැනීමට හැකි වෙතැයි ආසියානු තාක්ෂණ ආයතනය පවසයි.
1. ආනයනය කිරීමේදී ඇතිවන ප්‍රමාද දෝෂ නිසා පලතුරු නරක් වේ.
2. පලතුරු හොඳ තත්ත්වයෙන් කල් තබා ගැනීමට නව තාක්ෂණය උපයෝගී කර ගත යුතුය.
3. තාක්ෂණයේ ප්‍රයත්නය වී ඇත්තේ ආසියානු ආයතනයේ පලතුරු ආනයන ක්‍රම දියුණු කිරීමයි.
4. පලතුරු ආනයනයේදී ආසියානු ආයතනයේ තාක්ෂණය ද සහය කරගත යුතු බවට වාදයක් නැත.

(40) සතර වටින් වෙරළ නැගී පවුරු සදාලයි.
1. සිවු දෙසටම විහිදී ඇති දර්ශනීය සාගරය පවුරක් වැනිය.
2. සතර දිහාවෙන් ම එන වලාකුළු වෙරළ අලංකාර කරයි.
3. වටේටම ඇති වෙරළ රටට ආරක්ෂාව ගෙන දෙයි.
4. සෞන්දර්යාත්මක වෙරළ ප්‍රාකාර සතරක් මෙනි.